www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ග්‍රීක ආන්ඩුව, පුලුල් කරනලද ඇපදීමට හිලව් වශයෙන් ගැඹුරු කප්පාදුවලට එකඟ වෙයි

## Greek government agrees to deeper cuts in return for expanded bailout

බැරී ග්‍රේ විසිනි
2010 අප්‍රේල් 30

පුලුල් කරන ලද ඇප දීමක් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජාමූඅ), යුරෝපීය මහබැංකුව (ඊසීබී) හා යුරෝපා කොමිසම විසින් පනවන ලද කොන්දේසිවලට අනුකූලව, තම රටේ අයවැය හිඟය වඩාත් වේගයෙන් පහත හෙලීමට සැලසුම් කරන ලද නව කප්පාදු පියවර පිලිබඳ දල සැලැස්ම ඉදිරිපත් කිරීමට මාර්තු 29 දින ග්‍රීක අගමැති ජෝර්ජ් පැපැන්ද්‍රියෝ වෘත්තීය සමිති හා ව්‍යාපාර නායකයින් හමුවිය.

මෙම හමුව පැවැත්වුනේ, සමාජ වැය කැපීම, අමතර සේවා අත්හිටුවීම, තියුනු ලෙස වැටුප් හා විශ්‍රාම වැටුප් අඩුකිරීම හා අමතර බදු වැඩිකිරීම සම්බන්ධයෙන් එකඟත්වයකට පැමිනීම සඳහා ජාමූඅ, ඊසීබී හා යුරෝපා සංගමයේ නියෝජිතයන් සමග ග්‍රීක ආන්ඩුවේ නිලධාරීන් සාකච්ඡාවල යෙදී සිටියදීය. මැයි 19 වන විට ග්‍රීසිය සිය බැඳුම්කර හිමිකරුවන්ට යුරෝ බිලියන 8 ගෙවීමට නියමිතය. මැයි 07 වන විට යුරෝපීය ආන්ඩුවල අනුමැතිය ලබාගෙන, මැයි 19 දිනට පෙර අරමුදල් ගලායාම සහතික කලහැකිවන පරිදි, සති අන්තය වනවිට එකඟත්වයකට පැමිනීමට හැකි වෙතැයි නිලධාරීහු අපේක්ෂා කරති.

අර්බුදය පිලිබඳ ග්‍රීක සාකච්ඡා පැවතියේ, ජාමූඅ කලමනාකාර අධ්‍යක්ෂ ඩොමිනික් ස්ට්‍රවුස් ඛාන් හා ඊසීබී ප්‍රධානී ජෝන් ක්ලවුඩේ ට්‍රිචෙට් විසින් බදාදා සිදුකරන ලද මැදිහත්වීමෙන් අනතුරුවය. ග්‍රීසියට, ජාමූඅ හා යුරෝපීය සංගමය විසින් නිර්දේශ කරන ලද යුරෝ බිලියන 120 ක ප්‍රමානයේ ඇපදීමකට මුදල් යෙදවීම සඳහා, ඉක්මනින් එකඟත්වයකට නොපැමිනියහොත්, මුලු යුරෝ කලාපයේ මෙන්ම යුරෝපා සංගමයේත් ස්ථාවරත්වයට එයින් තර්ජනයක් එල්ල වනු ඇතැයි බර්ලිනයේදී ජර්මානු නීති සම්පාදකයන් හමුවූ මේ දෙදෙන අනතුරු ඇඟවූහ.

ඇපදීමේ නව සැලසුම කලින් එකඟවූ පැකේජයට වඩා තෙගුනයකට ආසන්න ප්‍රමානයකින් වැඩිය. ග්‍රීසියේ පමනක් නොව පෘතුගාලයේ හා ස්පාඤ්ඤයේ තත්වය ද වේගයෙන් පිරිහෙමින් තිබෙන ආකාරය ඉන් ප්‍රකාශ කෙරෙයි. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් යන නය වර්ගීකරන ආයතනය මාර්තු 27 දින ග්‍රීසියේ රාජ්‍ය නය අනුපාතය බාල බැඳුම්කර මට්ටමට ද පෘතුගාලයේ වර්ගීකරනය තියුනු ලෙස ද පහත හෙලීය. 28 දින ඔවුහු, ස්පාඤ්ඤයේ වර්ගීකරනය එක් අඩියකින් පහතට දැමූ අතර වැඩිදුර පිරිහෙලීම් සිදුවියහැකි බවට ද අනතුරු ඇඟවූහ.

පෘතුගාලයේ හා ස්පාඤ්ඤයේ බැඳුම්කර වර්ගීකරන පහත හෙලීම යුරෝපීය හා ජාත්‍යන්තර අර්බුදයේ නව අදියරක් සලකුනු කරයි. රාජ්‍ය නය අර්බුදයට, ජාතික නය පැහැර හැරීමේ තර්ජනය, බැංකු හා නය හිමියන්ගේ දැවැන්ත පාඩු හා මූල්‍ය අර්බුදයේ ප්‍රතික්‍රියා මාලාවක් ආවේනික වෙයි. මෙහි අර්ථය වන්නේ රාජ්‍ය නය, ග්‍රීසියේ සිට ඉහල නය බරක් සහිත අනෙකුත් රටවලට ද පැතිරගොස් ඇති බවයි. එතැන් සිට බ්‍රිතාන්‍ය, ජපානය හා එක්සත් ජනපදය වැනි දැවැන්ත නය බරින් ද අයවැය හිඟයන්ගෙන් ද පෙලෙන වඩා විශාල ආර්ථිකයන් කරා මෙය පැතිරයාම කාලය පිලිබඳ ප්‍රශ්නයක් පමනි.

ග්‍රීසිය වෙනුවෙන් ඇප දීම සඳහා ඉක්මනින් එකඟත්වයකට ඒමේ අපේක්ෂාවන් පිලිබිඹු කරමින් පාඩු වාර්තා කල දින දෙකකින් පසුව, යුරෝපීය කොටස් වෙලඳපොලවල් පසුගිය 29 දින ස්ථාවර විය. එම සතියේ මුල් දිනවල වේගයෙන් ඉහල නැඟීමෙන් පසුව ග්‍රීක පෘතුගාල ආන්ඩු බැඳුම්කරයන්ගේ පලදාව තරමක් පහත වැටුනි. එසේ වුවත් නය වර්ගීකරන අනුපාත පහත දැමීමේ ප්‍රතිපලය වන්නේ නය පිරිවැය වඩා ඉහල නැඟීමත්, ආයෝජකයෝ ආන්ඩු බැඳුම්කර විකුනා දැමීමත්ය. එමඟින් අර්බුදය වඩාත් දැඩි කර අවසානයේ නය පැහැර හැරීමේ සම්භාවිතාව වැඩි වීමයි.

අයහපත් අතට හැරෙමින් තිබෙන මූල්‍ය අර්බුදය හමුවේ, එහි මුලු බර කම්කරු පන්තිය විසින් දැරිය යුතු යයි සියලු නිල පක්ෂ එකඟත්වයකට පැමින සිටිති.

සිය නය තක්සේරුව පහත හෙලීම සම්බන්ධයෙන් පෘතුගාල ආන්ඩුව ප්‍රතිචාර දැක්වූයේ සිය දැඩි කප්පාදු පිලිවෙත ක්‍රියාත්මක කිරීම වේගවත් කරන බව කියා සිටිමින්ය. ඒ අනුව පෘතුගාල ආන්ඩුව මුලින් සැලසුම්කල පරිදි 2011 වසර වෙනුවට මේ වසර තුලම කප්පාදු වැඩ සටහන් මාලාවක්ම නිවේදනය කර ඇත. නව මාර්ග ගාස්තු හඳුන්වාදීමේ සැලසුම් වේගවත් කිරීමටත්, විරැකියා හා අනෙකුත් ශුභසාධක ගෙවීම් සඳහා පිරිවැය කැපීමටත් තමා කටයුතු කරමින් සිටින බව පෘතුගාල සමාජවාදී පක්ෂ අගමැති ජොසේ සොක්‍රටීස් කියා සිටියේය.

"රාජ්‍ය හිඟ අඩුකිරීම සඳහා අප පිහිටුවා ඇති ඉලක්ක මුදුන් පමුනුවා ගැනීමට අවශ්‍ය ඕනෑම පියවරක් ගැනීමට අප පූර්න වශයෙන් අධිෂ්ඨාන කරගෙන සිටින්නෙමු" යයි ඔහු පැවසීය.

ඒ සමග ම,  සිය නය වර්ගීකරන අනුපාතය පහත හෙලීම සම්බන්ධයෙන් ස්පාඤ්ඤයේ සමාජවාදී කම්කරු පක්ෂ ආන්ඩුව ක්ෂනිකව ප්‍රතිචාර දැක්වූයේ සිය දැඩි කප්පාදු වැඩ සටහන ක්‍රියාවට නගන බවට ප්‍රතිඥා දීමෙනි. "මූල්‍ය ශක්තිය වර්ධනය කිරීමේ හා හිඟ අඩුකිරීමේ වගකිවයුතු සැලැස්මක් අප සතුව ඇත. අපි දැඩි පිරිමැසුම්දායක වැඩ පිලිවෙලක් අතැතිව සිටින්නෙමු. ශ්‍රම වෙලඳපොල ප්‍රතිසංස්කරනය ද පොරොන්දු ඉටුකිරීමට අවශ්‍ය සියලු පියවර ද ගැනීමට අප සූදානම්ව සිටින්නෙමු. එබැවින් ජනතාවට විශ්වාසය ද වෙලඳපොලවලට සන්සුන් බව ද ගෙනදීමේ පනිවිඩය යැවීමට කැමැත්තෙමි." යයි නියෝජ්‍ය අගමැති මාරියා තෙරේසා ද ලා වේගා වාර්තා කරුවන් අමතමින් කියා සිටියාය.

විරැකියාව සියයට විස්සක්ව තිබිය දී පෙබරවාරි මාසයේ ආන්ඩුව, වසර තුනක් ඇතුලත අයවැයෙන් යුරෝ බිලියන 50ක් කපාහැරීමේ සැලැස්මක් නිවේදනය කලේය. ආන්ඩුවේ වියදම් කැපීම, රජයේ සේවකයන් බඳවා ගැනීම මුලුමනින්ම පාහේ නතර කිරීම හා බදු වැඩිකිරීමටත් මේ සැලසුමෙන් අරමුනු කරයි.

නෛතික විශ්‍රාම වයස් සීමාව අවුරුදු 65 සිට 67 දක්වා වැඩි කිරීමත් ගිනි නිවන කම්කරුවන්ට සිය සේවාව වඩා පහසු කිරීමත් වියදම් අඩු කිරීමත් මීට ඇතුලත්ය.

"අවශ්‍ය වුවහොත් තවත් වියදම් කැපීමටත් තවත් පිරිමැසුම් පියවර ඉල්ලා සිටීමටත්" සිය ආන්ඩුව අරමුනු කරගෙන සිටින බව අගමැති රොද්‍රිගුස් සැපටාරෝ අප්‍රේල් මුල් දිනවල කියා සිටියේය.

පැපැන්ද්‍රියෝගේ ග්‍රීක ආන්ඩුව ද ඒ හා සමාන නාමික "සමාජවාදී" පක්ෂ තන්ත්‍රයකි. එසේ වුවත් පෘතුගාලයේ හා ස්පාඤ්ඤයේ සිය සහකරුවන් මෙන්ම ග්‍රීක පැසොක් පක්ෂය ද තමන් සමග පෙලගැසී සිටින වෘත්තීය සමිතිවල පිටුබලය ලබන හා දිගු කලෙක සිටම සේවයට කැපව සිටින ධනපති සංවිධානයකි.

ජාත්‍යන්තර බැංකු, ඇවුරුම් අරමුදල්, හා සමපේක්ෂකයන්ගේ ද ඔවුන්ගේ ජාතික ධනපතියන්ගේ ද අන පරිදි කම්කරු පන්තිය මත එල්ල කරන ඓතිහාසික මෙන්ම කුරිරුවූ ද ප්‍රහාර දැන් මේ සියලු "වාම" යයි කියාගන්නාවූ පක්ෂ විසින් සියතට ගෙන තිබේ. "රට ගලවාගැනීමට අවශ්‍ය දෑ අපි කරන්නෙමු" යයි ව්‍යාපාර හා වෘත්තීය සමිති නායකයින් අමතා පැපැන්ද්‍රියෝ කියා සිටියේය. කලින් ඉදිරිපත් කෙරුනු කප්පාදු පැකේජයේ සඳහන් වූ පරිදි අයවැය හිඟය, දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 7 න් නොව 2012 වන විට සියයට 10 න් කපාහැරීම නව සැලැස්ම යටතේ සිදුවනු ඇතැයි රැස්වීමෙන් පසුව වෘත්තීය සමිති නායකයෝ පැවසූහ.

ග්‍රීක දුම්රිය පද්ධතියේ ඇතැම් අංශ වසා දැමීම, සාමුහික ගිවිසුම් යලි ගෙන ඒමට වෘත්තීය සමිතිවලට පවතින ඉඩකඩ සීමා කිරීම, සිය වාර්ෂික වැටුපට අමතරව පුද්ගලික අංශයේ කම්කරුවන්ට හිමිවන දෙමාසයක බෝනස් මුදල කපා දැමීම, විශ්‍රාම යන වයස් සීමාව දීර්ග කිරීම හා විශ්‍රාම වැටුප් කැපීම වාර්තාවන පරිදි සාකච්ඡාවට බඳුන්වන මාතෘකා ය.

සාකච්ඡා කෙරෙමින් ඇති අනෙකුත් පියවරයන් අතර පාරිභෝජනය මත පනවනු ලබන වැට් යන නිගාමී බද්ද දැනට පවත්නා සියයට 21 සිට තවත් සියයට 2-4 අතර ප්‍රමානයකින් ඉහල දැමීම, ඉන්ධන දුම්කොල හා මද්‍යසාර බදු යටත් පිරිසෙයින් සියයට 10 න් වැඩිකිරීම ද වන බව සාකච්ඡාවලට සම්බන්ධ කොටස් පවසා තිබේ. රාජ්‍ය අංශයේ අඩේඩි වෘත්තීය සමිතියට අනුව, එහි කම්කරුවන්ට බලපාන තෙවසරක වැටුප් ඇවුරුමක් ද වාර්ෂිකව ගෙවන වේතන 14 න් 2 ක් අහෝසි කිරීම ද පූර්නකාලීන රාජ්‍ය අංශ රැකියා කප්පාදුව ද මේ පියවරයන්ට අන්තර්ගතවිය හැකිය. සිය ශ්‍රම බලකාය කපාහැරීමේ අනුපාතය දැනට තිබෙන සියයට 2 සිට සියයට 4 දක්වා වැඩිකිරීමට සමාගම් වලට අවසර දීම තවත් යෝජනාවකි.

ග්‍රීක ආන්ඩුව විසින් කලින් යොදාගෙන තිබුනු දැඩි කප්පාදු පියවරයන් සම්බන්ධයෙන් ප්‍රබල විරෝධයක් පලව තිබුනි. නව පියවරයන්ගේ ප්‍රතිපලය වනු ඇත්තේ ජනතාවගේ කෝපය හා විරෝධය තවත් වර්ධනය වීමයි. මැයි 1ට වරාය වැඩවර්ජනයක් නියමිතව ඇති අතර අඩේඩි හා පුද්ගලික අංශයේ ජීඑස්ඊඊ වෘත්තීය සමිති මැයි 5 දිනට එක් දින මහා වැඩවර්ජනයක් කැඳවා තිබේ. එහෙත් පැපැන්ද්‍රියෝ සමඟ පැවති සිය හමුවෙන් පසුව වෘත්තීය සමිති නිකුත් කලේ වැනෙන සුලු ප්‍රකාශයකි. කප්පාදු පිලිවෙත් අවහිර කිරීම සඳහා ජනතා විරෝධය පෙලගැස්වීමේ කිසිදු බලාපොරොත්තුවක් තමන්ට නැතැයි එමගින් ඔවුහු සංඥා කලහ. යෝජනා "කර්කෂ හා අසාධාරන ඒවා" බව කියාසිටි ජීඑස්ඊඊ සභාපති යනිස් පැනගොපුලෝස්, සමිතිවල ප්‍රතිරෝධය  "වැඩි කිරීම" පිලිබඳ අනිශ්චිත තර්ජනයක් නිකුත් කලේය.

කම්කරු පන්ති ප්‍රතිරෝධය පාලනය කිරීමට හා වාෂ්පකර දැමීමට වෘත්තීය සමිති උපරිම ලෙස වෑයම් කරන බවට ග්‍රීක ව්‍යාපාරික ප්‍රභූව මනාව අවබෝධ කරගෙන සිටියි. "ග්‍රීක සම්මතයන්ට අනුව වෘත්තීය සමිති මෙතෙක් දක්වන ලද ප්‍රතිචාරය මෘදු එකක්" යයි ග්‍රීක ජාතික බැංකුවේ ජ්‍යේෂ්ඨ අර්ථශාස්ත්‍රඥ නිකෝස් මැගිනීස් කියා සිටියේය.

© www.wsws.org